# National Union of Seafarers Sri Lanka

## SLFAT Branch Union

NUSS REG No. 7735

ශ්‍රී ලංකාවේ ඇප් ප්‍රවාහකයන්ගේ ශාඛා සමිතිය

இலங்கை செயலி சார்ந்த போக்குவரத்துத் தொழிலாளர்கள் கூட்டமைப்பு

No.532/5, Elvitigala Mawatha, Colombo 05, Sri Lanka. (+94)11 258 3030 / (+94)11 258 3040

| Charith Attanapola | M. I. M. Jesmin | Rahuman Pallie | Nimesha Sampath | Ushan Madushanka |
|---|---|---|---|---|
| (+94) 705 001 002 | (+94) 777 636464 | (+94) 760 777230 | (+94) 705 001 122 | (+94) 777 422 614 |
| President | Vice President | Secretary | Assist. Secretary | Treasurer |


2025 – 12 – 22.

සභාපතිතුමා,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,
කොළඹ.

ගරු සභාපතිතුමනි,

**<u>ශ්‍රී ලංකාවේ කුලීරථ රියදුරන්ට බියෙන් සැකෙන් සහ හිංසනයෙන් තොරව නිදහසේ රැකියාවක් කිරීමේ අයිතිය සහ වෘත්තීය ගරුත්වය සුරක්ෂිත කිරීම සඳහා කරනු ලබන පැමිණිල්ලයි.</u>**

අධිරාජ්‍යවාදී යුගයේ ආසියාවට මුලින්ම මෝටර් රථ හඳුන්වා දුන් අවධියේ සිට අද දක්වා ශ්‍රී ලංකාවේ කුලීරථ කර්මාන්තය මෙරට ආර්ථිකයේ හා සමාජ සබඳතාවල තීරණාත්මක පුරුකක්ව පැවතුණි. එදා සිට දශක ගණනාවක් පුරා කුලීරථ රියදුරා සහ මගියා අතර පැවතියේ අන්‍යෝන්‍ය අවබෝධය මත පදනම් වූ ගනුදෙනුවකි. රියදුරා විසින් තමාගේ දෛනික ජීවන වියදම, ඉන්ධන සහ වාහනයේ නඩත්තු පිරිවැය සලකා බලා සාධාරණ ගාස්තුවක් යෝජනා කළ අතර, මගියාගේ එකඟතාවය මත එම සේවාව ඉටු විය. එය හුදෙක් මුදලට සීමා වූ ගනුදෙනුවක් නොව, පවුල් නඩත්තු කරන අඩු ආදායම්ලාභී මිනිසුන්ගේ ජීවන අරගලයට ලැබුණු ගෞරවනීය අත්වැලකි.

2015 වර්ෂයේදී Uber සහ PickMe වැනි රයිඩ්-හේලිං (Ride-hailing) ආයතනවල ආගමනයත් සමඟ මෙම මානුෂීය ගනුදෙනුව බරපතල ලෙස බිඳවැටීමට ලක් විය. රියදුරාට තම ශ්‍රමය සහ වාහනය වෙනුවෙන් ලැබිය යුතු වටිනාකම තීරණය කිරීමේ අයිතිය අහිමි කරමින්, අතරමැදි තාක්ෂණික සමාගම් විසින් ඔවුන්ගේ ලාභය පමණක් අරමුණු කරගනිමින් ගාස්තු තීරණය කිරීම ආරම්භ විය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස:

- **<u>ආර්ථික දරිද්‍රතාවය සහ අසාධාරණ ගාස්තු:</u>** පවතින උද්ධමනය හමුවේ තම දරුවන්ගේ අධ්‍යාපනය, ආහාර සහ වාහන ලීසිං වාරික පවා ගෙවා ගත නොහැකි මට්ටමට රියදුරාගේ ආදායම පහත වැටී ඇත. සමාගම් විසින් පාරිභෝගිකයා ආකර්ෂණය කරගනු පිණිස පනවන අඩු ගාස්තු හමුවේ, රියදුරා තම ජීවිතය පවා පරදුවට තබා දවසේ වැඩි කාලයක් මහමග රිය පැදවීමේ අවදානමකට තල්ලු වී තිබේ.

- **<u>ක්ෂේත්‍රය තුළ නිර්මාණය වී ඇති ගැටුම්</u>**: සාම්ප්‍රදායික රියදුරා සහ මෙම ජංගම දුරකථන යෙදවුම් හරහා සේවය සපයන රියදුරා අතර මතු වී ඇති ගැටුම හුදෙක් වෘත්තීය තරඟයක් නොව, බඩගින්න හා ජීවත්වීමේ අරගලය නිසා හටගත් ඛේදවාචකයකි. විශේෂයෙන් සංචාරක කලාප, හෝටල් සහ ගුවන් තොටුපල ආශ්‍රිතව සිදුවන පහරදීම් සහ අඩන්තේට්ටම් මෙම පීඩනයේ දරුණුතම ප්‍රතිඵලයන් වේ.

- **<u>නීතියේ පක්ෂපාතීත්වය</u>**: මෙම ගැටුම්කාරී අවස්ථාවලදී පොලිසිය සහ බලධාරීන් අපක්ෂපාතීව නීතිය ක්‍රියාත්මක කරනවා වෙනුවට, යම් පාර්ශවයන්ට පමණක් අනුබල දීම තුළින් සාධාරණව රැකියාව කර ජීවත් වීමට වෙර දරන රියදුරන්ගේ මූලික මානව අයිතිවාසිකම් දරුණු ලෙස උල්ලංඝනය වෙමින් පවතී.

ගරු සභාපතිතුමනි,

මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රතිරූපයට කැළලක් වනවා සේම, දහස් සංඛ්‍යාත රියදුරු පවුල් තවදුරටත් දරිද්‍රතාවයේ අගාධයට ඇද දමන්නකි.

එබැවින්, මෙම පීඩිත ජන කොට්ඨාශයේ ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කරනු පිණිස පහත පාර්ශවයන් වෙත අවශ්‍ය නියෝග සහ මාර්ගෝපදේශ නිකුත් කරන ලෙස අපි ඔබතුමාගෙන් ඉතා බැගෑපත්ව ආයාචනා කර සිටිමු:

- **<u>ප්‍රවාහන අමාත්‍යවරයා සහ බලධාරීන්ට</u>**: රියදුරාගේ නඩත්තු වියදම්වලට සරිලන විධිමත් ගාස්තු නියාමන යාන්ත්‍රණයක් සකස් කරන ලෙස.
- **<u>සංචාරක අමාත්‍යවරයා සහ බලධාරීන්ට</u>**: සංචාරක ගමනාන්තයන්හිදී සියලු රියදුරන්ට සාධාරණව හා ආරක්ෂිතව සේවය සැලසීමට ඉඩකඩ ලබා දෙන වැඩපිළිවෙළක් සකස් කරන ලෙස.
- **<u>මහජන ආරක්ෂක අමාත්‍යවරයා සහ පොලිස්පතිවරයා වෙත</u>**: ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට සහ පොලිසියේ පක්ෂග්‍රාහී ක්‍රියාකලාපයන් නැවැත්වීමටත්, සියලුම රියදුරන් වෙනුවෙන් අපක්ෂපාතී නීතියක් ක්‍රියාත්මක කිරීමටත් ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කරන ලෙස.

මෙම අසරණ මිනිසුන්ගේ ජීවන අරගලය දෙස සානුකම්පිතව බලා, මානව හිමිකම් කොමිෂන් සභාව මැදිහත් වී යුක්තිය ඉටු කර දෙනු ඇතැයි අපි මහත් විශ්වාසයෙන් බලාපොරොත්තු වෙමු.

**<u>විශේෂ සාක්ෂි සහ නිරීක්ෂණ:</u>**

මෙම ගැටලුවේ බරපතලකම තහවුරු කිරීම සඳහා මෑතකදී සංචාරක මර්මස්ථානයක් වන ඇල්ල ප්‍රදේශයේදී සිදුවූ පීඩිත රියදුරෙකුට එල්ල වූ අඩන්තේට්ටම් සහ තර්ජන ඇතුළත් වීඩියෝ දර්ශන (පහත සබැඳිය ඔස්සේ) ඔබතුමාගේ අවධානයට යොමු කරමු.
සබැඳිය: https://www.facebook.com/share/17qCi6TWCs/

මෙම වීඩියෝව තුළින් අප පෙන්වා දෙන පහත කරුණු මැනවින් නිරාවරණය වේ:

1. රැකියාව සඳහා පැමිණි රියදුරෙකුට සංවිධානාත්මක පිරිසක් විසින් සිදුකරන දරුණු **<u>මානසික හා වාචික පීඩාව.</u>**
2. පොලිස් නිලධාරීන් එම ස්ථානයේ සිටියදීම, වින්දිත රියදුරාට ආරක්ෂාව සලසනවා වෙනුවට පක්ෂග්‍රාහීව කටයුතු කරමින් ඔහුව අසරණ කරන ආකාරය
3. විදේශීය සංචාරකයන් සිටින පරිසරයක් තුල සිදුවන මෙම ක්‍රියාවන් තුළින් මෙරට සංචාරක කර්මාන්තයට සිදුවන ගණනය කළ නොහැකි හානිය.

ස්තූතියි.
මෙයට,

........................................................

චරිත් අත්තනපොල.
සභාපති,
ශ්‍රී ලංකාවේ ඇප් ප්‍රවාහකයන්ගේ ශාකා සමිතිය.

පිටපත්:

1. ගරු පොලිස්පතිතුමා, පොලිස් මූලස්ථානය.
2. ගරු සභාපති, ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව.